www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ පරිහානිය හා සමාජවාදය සඳහා අවකාශ

## The historic decline of US imperialism and the prospects for socialism

**නික් බීම්ස් විසිනි**

**2005 පෙබරවාරි 01**

### 1 වන කොටස

*ජනවාරි 29-30 සති අන්තයේ දී, සමාජවාදී සමානතා පක්ෂය (සසප) ඕස්ට්‍රේලියාවේ, සිඩ්නි හි දී සිය ජාතික සාමාජිකත්වයේ රැස්වීමක් පැවැත්වී ය. පහත පල කරන්නේ ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජික නික් බීම්ස් ඉදිරිපත් කල ආරම්භක වාර්තාවේ 1 වන කොටස යි. ඉතිරි කොටස් තුන ඉදිරියේ දී පල කෙරෙනු ඇත.*

නිතර පැනනගින්නා වූ ස්වාභාවික විපත් සම්බන්ධ කාරනය සේම, දෙසැම්බර් 26 දින ආසියානු සුනාමිය ද දශලක්ෂ සංඛ්‍යාවක් ජනතාවට සිදු කල හානිය, වර්තමාන සමාජ පර්යායේ අත්‍යාවශ්‍ය ව්‍යූහාත්මක අංග හා ක්‍රියාවලීන් සමහරක් නග්නාකාරව විදහා දක්වයි.

සුනාමියට හේතු වූයේ පෘථිවියේ ගැඹුරු අභ්‍යන්තරයෙහි හට ගත් භූ තලයන්ගේ චලනයක් වුවත්, එහි ප්‍රතිවිපාකයන්, භූගෝලීය ධනවාදී ආර්ථිකයේ හදවතෙහිම ක්‍රියාත්මක වන්නා වූ සමාජීය බලවේගයන්ගේ, ප්‍රතිඵලය විය.

ස්වාභාවික විපතක් නිසා ඉහලම ජීවිත හානි සිදු වූ එක් අවස්ථාවක් වන මෙම සුනාමියේ, වාර්තාගත මරන සංඛ්‍යාව දෙලක්ෂ පනස්දහස ඉක්මවා ඇති අතර එය පලල්ව පැතිරුනු දරිද්‍රතාවයේ ප්‍රතිඵලයක් විය. කලාපයට එහි ම සුනාමි අනතුරු ඇඟවුම් පද්ධතියක් නො තිබුනු අතර දශ ලක්ෂ ගනනකට ඔවුන්ගේ ජීවන තත්වයන් නිසා ම, ඊට ගොදුරු විය. මෙම දුගී භාවය කිසියම් අවාසනාවන්ත සිදුවීමක් හෝ අහම්බයක් නොව, භූගෝලීය ධනවාදයේ ම ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය වන ආර්ථික ක්‍රියාවලියේ ප්‍රතිඵලයයි.

සාරය වසයෙන්, ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය, නිමක් නැති අතිරික්ත වටිනාකම් සමුච්ඡයය ඇතුලත් කර ගනියි. එහි මූලාශ්‍රය කම්කරු පන්තියේ ජීවමාන ශ්‍රමය යි. පසුගිය විසිපස් වසර තුල ප්‍රාග්ධන සමුච්ඡයේ ක්‍රියාවලිය මහත් වෙනස්කම්වලට භාජන වී ඇත. අතිරික්ත වටිනාකම් උපුටා ගැනීම දැන් සිදුවන්නේ, අන් සියල්ලටම වඩා, ලාභ ශ්‍රම සම්පත් කරා පිවිසීම මත පදනම් වන සංකීර්න භූගෝලීය නිෂ්පාදන ක්‍රියාවලියක් හරහා ය.

සුනාමියෙන් පසුව, මිනිසාගේ විනාශය හා දුක් වේදනාවන්ගේ පරිමාව මධ්‍යයේ ම, ලෝකයේ මෙන්ම කලාපයේ මත් කොටස් වෙලඳපොලවල් මඳකුදු පසු නොබෑ බව පුලුල්ව අවධානයට ලක් විය. මින් ඇඟවෙන්නේ ධනපති දේපල සහ වස්තුව සම්බන්ධයෙන් ගත් කල මහා ජීවිත හානිය නොතැකිය යුතු දෙයක්ය යන්නයි. එහෙත් එය, දකුනු ආසියාවේ දුප්පත් ජනගහනය, සමුච්ඡය ක්‍රියාවලියේ අවධානයට ලක් වන තරමේ ක්‍රියාකලාපයක් ඉටු නො කරන බවක් අර්ථගැන්වෙන අයුරින් නො ගත යුතු ය. සැබවින් ම ඔවුන්, ලාභානුපාතිකය පවත්වා ගැනීම සඳහා වේතන මත නිරන්තරව පහලට තල්ලු කරන පීඩනයක් යොදවන්නා වූ යෝධ අතිරේක ශ්‍රම හමුදාවක වැදගත් ක්‍රියා කලාපයක් ඉටු කරයි. මෙම සංසිද්ධිය අවතක්සේරු නො කල යුතු ය. 1960 වසරේ පටන් ලෝකයේ ධනය අට ගුනයකින් ඉහල ගොස් ඇතත් ලෝක ජනගහනයෙන් හරි අඩක් ජීවත්වන්නේ දිනකට ඩොලර් දෙකකට අඩුවෙන් හා හතරෙන් පංගුවක් දිනකට එක් ඩොලරයකට අඩුවෙන් ය.

භූගෝලීය ආර්ථිකයේ තවත් වැදගත් ලක්ෂනයක් වන්නේ මූල්‍ය ප්‍රාග්ධනයේ උච්ච වූ ක්‍රියාකලාපය යි. දිලිඳුතම රටවලින් නය හා පොලී වසයෙන් උරා ගන්නා විශාල ධන සම්භාරය සමුච්ඡය ක්‍රියාවලියේ දී ඉටු කරන්නේ සුලුපටු ක්‍රියාකලාපයක් නො වේ. ඊනියා ඌන සංවර්ධනය පිටුදැකීම් වස් සංවර්ධිත ධනේශ්වර රටවල් ආධාර සැපයීමට යොමු වූ කාල පරිච්ඡේදය ඈත අතීතයේ දෙයකි. 1982 දී හටගත් මෙක්සිකානු නය අර්බුදය මෙම සංක්‍රමනයේ ආරම්භක ලක්ෂ්‍යය යි. ඉන් පසුව ලෝකයේ ප්‍රධාන බැංකු වෙනුවෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, දිලිඳු ම රටවල් මත "ව්‍යූහාත්මක නිවැරදි කිරීමේ" වැඩ සටහන් පැටවීම ආරම්භ කලේ ය. මෙම නය අර්බුදයේ පටන් දිලිඳු රටවල් ධනවත්ම රටවල් වෙත ඩොලර් බිලියන 3450ක් ගෙවා ඇති බවට ගනන් බලා තිබේ. එය මාර්ෂල් සැලැස්මවල් 43කට සමාන ය. 1999 වසර තුල පමනක්

ඊනියා තුන්වන ලෝකයෙන් ගෙවා ඇති නය ප්‍රමානය, වත්මන් මිල ගනන් අනුව මාෂල් සැලැස්මවල් හතරකට සමාන ඩොලර් බිලියන 300කි.

මෑත ම ලෝක බැංකු වාර්තාවන්ට අනුව සුනාමියෙන් විපතට පත් රටවල් පහක්, වාර්ෂිකව ඩොලර් බිලියන 32 බැගින් ආපසු ගෙවන ඩොලර් බිලියන 300ක විදේශ නය, එම රටවලට පොරොන්දු වී ඇති ආධාර මෙන් කිහිප ගුනයකි. ලෝකයේ නය ගැති රටවල් ධනවත්ම රටවලට වාර්ෂිකව ඩොලර් බිලියන 230 කට වඩා ආපසු ගෙවයි. ඔක්ස්ෆෑම් නම් බ්‍රිතාන්‍ය ආධාර සංවිධානයට අනුව දුප්පත්ම රටවල් දිනකට ඩොලර් මිලියන 100 බැගින් නය ආපසු ගෙවයි. මෙම මුදල ඉන්දියාවේ මිලියන 18ක ජනතාවට පානීය ජල අවශ්‍යතා වහාම සැපයීමට තරම් සෑහෙයි. 2002 වසරේ දී තායිලන්තය, ඉන්දියාව, හා ශ්‍රී ලංකාව එකතුව ඩොලර් බිලියන 50ක් නය සේවා සඳහා ගෙවා ඇත. ඉන්දුනිසියාවේ දී 2004 සඳහා නය ආපසු ගෙවීම් සෞඛ්‍ය සඳහා වැය කිරීම්වලට වඩා දහ ගුනයක් ද නිවාස සඳහා වැය කිරීම්වලට වඩා 33න් ගුනයක් ද විය.

1997-98 දී රට විනාශයට පත් කල මූල්‍ය සුනාමියේ ප්‍රතිඵල වසයෙන් ඉන්දුනිසියාවේ දී සුනාමියෙහි බලපෑම් උත්සන්න කෙරී ඇත. අර්බුදයෙන් පසුව රාජ්‍ය නය දෙගුනයකටත් වඩා ඉහල ගොස් ඇති අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් (දදේනි) සියයට 90 ක් පමන වන ඩොලර් බිලියන 130 ක් වී ඇත. මුලු විදේශ නය ඩොලර් බිලියන 143 වන අතර නය සේවා ගාස්තු රාජ්‍ය ආදායමෙන් හරි අඩක් පමන වේ. 1995-96 පටන් සමාජ සේවා වියදම් මූර්ත වටිනාකම් අනුව සියයට 40කින් පහත වැටී ඇති අතර 1997 දී ජනගහනයෙන් සියයට 11ක් වූ දරිද්‍රතා රේඛාවෙන් පහල ජනසංඛ්‍යාව, අද සියයට 50 දක්වා පමන වැඩි වී ඇතැයි ගනන් බලා තිබේ. 1997-98 පටන්, මිලියන 39කට රැකියා අහිමි කරමින් මිලියන 100ක් ජනතාව දුගී භාවයට ඇද හෙලා ඇති බවට ගනන් බලනු ලැබී ය.

එක්සත් ජාතීන්ගේ ගනන් බැලීම්වල වඩාත්ම සිත් කාවදින සංඛ්‍යා ලේඛනවලට අනුව, ග්‍රහලෝකයේ සෑම අයෙකුට ම පිරිසිදු පානීය ජලය, නිවාස, ප්‍රමානවත් ආහාර ප්‍රාථමික අධ්‍යාපනය හා සෞඛ්‍ය පහසුකම් ඇතුලු මූලික අවශ්‍යතාවන් සැලසීමට වැය වනු ඇත්තේ වසරකට ඩොලර් බිලියන 80ක් පමනකි. මෙම ප්‍රමානය එක්සත් ජනපද මිලිටරි වියදම් ශීර්ෂයෙන් සුලු කොටස කි. මෙය ඉරාකයේ මිලිටරි ග්‍රහනය පවත්වා ගැනීමට බුෂ් පරිපාලනය දැනට ඉල්ලා සිටින අතිරේක අරමුදලට සමාන මුදලකි.

සුනාමියේ බලපෑම ආර්ථික සන්තති ඉස්මතු කර ඇතුවා පමනක් නො වේ. එය දේශපාලන සන්තති ද ආලෝකමත් කර තිබේ. අධිරාජ්‍යවාදී බලයන්ගේ ප්‍රමුඛ නායකයන් වෙතින් පල වූ උදාසීන හා ඇල් මැරුනු ප්‍රතිචාරය අහම්බයක් නොව ඔවුන්ගේ දේශපාලන දෘෂ්ටියෙහි පිලිබිඹුවකි. -- දශ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ඉරනම ඔවුන්ගේ උත්සුකතාව නො වේ. ඔවුන් ප්‍රතිචාර දැක්වූයේ, දේශපාලන, මිලිටරි, හා ආර්ථික අරමුනු කරා පවා ඉදිරියට යාමට අවස්ථාවක් සුනාමිය මගින් සම්පාදනය කර ඇති බව හඳුනාගැනීමෙන් පසුව හෝ අඩු තරමින් ඔවුන්ගේ උපදේශකයන් එසේ කියා සිටීමෙන් පසුව පමනකි.

සුපැහැදිලි නිදසුන්වලින් එකක් ඕස්ට්‍රේලියානු අගමැති ජෝන් හොවාඩ් විසින් සම්පාදනය කලේ ය. ඉන්දුනිසියාවට සපයනු ඇතැයි සැලකෙන ඩොලර් බිලියනයෙන් වැඩි කොටසක් වාසිදායක කොන්ත්‍රාත් මගින් ඕස්ට්‍රේලියානු සමාගම්වල සේප්පු කරා යලි පැමිනෙනු ඇත. ආධාර සැපයීමට මෙම පෙලඹීම පවා බැඳී ඇත්තේ තෙල්වලින් පොහොසත් කලාපයේ ඕස්ට්‍රේලියානු ආර්ථික අවශ්‍යතාවන්ට හා ඉන්දුනිසියානු මිලිටරිය සමග කිට්ටු සබඳතා ඇති කර ගැනීමේ ආන්ඩුවේ තල්ලුව සමග මිස අසේ ප්‍රාන්තයෙහි ජනතාව ගැන කැක්කුමක් සමගින් නො වේ.

බුෂ් පරිපාලනයේ පටන් අන් සියලු අධිරාජ්‍යවාදී බලවතුන් දක්වා පවතින දෘෂ්ටිය සුපැහැදිලි ලෙස කැටිකොට දැක්වූයේ අනුප්‍රාප්තික රාජ්‍ය ලේකම් කොන්ඩලිසා රයිස් විසින් සෙනෙට් විදේශ සම්බන්ධතා කමිටුව පැවැත්වූ කරුනු විමසීමේ සැසිය තුල දී ය.

සුනාමියට ප්‍රතිචාර වසයෙන් එක්සත් ජනපදය කරන්නේ කුමක් දැයි විමසූ සෙනෙට් සභික වයනොවිච්ට පිලිතුරු ලෙස ''අනර්ගයි'' යනුවෙන් ඇය ප්‍රකාශ කලා ය. ''සුනාමිය එක්සත් ජනපද ආන්ඩුවට පමනක් නොව ඇමරිකානු ජනතාවට ම සිය ලෙන්ගතු කම පෙන්වීමට ලැබුනු අනගි අවස්ථාවක් ය යන්නට මම ද එකඟ වෙමි. එය අපට දැවැන්ත ලාභාංශයක් ගෙවා ඇතැයි ද මම කල්පනා කරමි.''

එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අවශ්‍යතාවයන් පෙරට ගෙන යාමට අවස්ථාවන් සපයා දෙන ව්‍යසනයන් හා ඛේදවාචකයන් රයිස්ට විශේෂ ආකර්ශනයක් ඇති දේ ය. 2002 අප්‍රේල් මාසයේ පැවති ජාතික ආරක්ෂක මන්ඩලයේ ජ්‍යෂ්ඨයින් එකට එක්කල හමුවක දී සැප්තැම්බර් 11න් ක්ෂනික ඉක්බිත්තේ, ලෝකයේ හැඩය වෙනස් කිරීමට ''ඔබ මෙම අවස්ථාවන් ප්‍රයෝජනයට ගන්නේ කෙසේ දැයි '' බැරෑරුම්ව සිතා බලන ලෙස ඉල්ලා සිටි ආකාරය ඇය විස්තර කලා ය. රයිස් සීතල යුද්ධයේ ආරම්භක කාලපරිච්ඡේදයට මෙම අවධිය සමාන කලා ය. ''ජාත්‍යන්තර දේශපාලනයේ භූ තලයන්'' මාරුවීමට පටන්ගෙන ඇති අතර ''ඒවා යලි සවිමත් වීමට ප්‍රථම ඇමරිකානු අවශ්‍යතාවන් ද ආයතනයන් ද ඇතුලු සියල්ල ස්ථානගත කිරීම සඳහා එම අවස්ථාව අල්ලාගැනීමට උත්සාහ කිරීම වැදගත්'' වේ.

දශක ගනනාවක් තිස්සේ වැසී තිබුනා වූ ලෝකයේ විවිධ ප්‍රදේශවල, එක්සත් ජනපද හමුදා රඳවා තැබීම, ''ත්‍රස්තයට එරෙහි යුද්ධය'' ලෙස දැක ගතහැකි වූ පරිද්දෙන්ම, සුනාමි සහනාධාර මෙහෙයුම්, එක්සත් ජනපද මිලිටරියට නව අවස්ථාවන් විශේෂයෙන්ම ශ්‍රී ලංකාවේ දී හා ඉන්දුනිසියාවේ සම්පාදනය කර තිබේ.

## සමාජවාදය සඳහා අවකාශ

එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂය ජනවාරි 8-9 දිනවල ඈන් ආබර්හි පැවැත්වූ රැස්වීමෙන් පසුව පැවැත්වෙන මෙම ඒකාබද්ධ රැස්වීම ඉදිරිදර්ශනය වර්ධනය කිරීමෙහි ලා උනන්දු වෙයි. ලෝක තත්වය පිලිබඳව අපගේ අගැයීම කුමක් ද? මෙම තක්සේරුවෙන් ගලා එන කර්තව්‍යයන් කවරේ ද? 21වැනි සියවසේ සමාජවාදය සඳහා ලෝක පරිමාන අවකාශයන් අප තක්සේරු කරන්නේ කෙසේ ද?

ඉදිරිදර්ශනය වර්ධනය කිරීමේ දී අප උත්සුකවන්නේ ඓතිහාසික සන්තති අගැයීම සම්බන්ධයෙනි. එනම් ''සිද්ධීන්ගේ දිගහැරීම'' අප තැබීමට බලාපොරොත්තු වන්නේ, අපගේ ම ව්‍යාපාරය විසින් ගෙන ගිය අරගලයන් හා කරන ලද පූර්ව විශ්ලේෂනයන් වැදගත් සංරචක කොටසක් බවට පත් වූ පුලුල් ඓතිහාසික සන්දර්භයක් තුල ය. ඉදිරිදර්ශනයක්, පැවැති තත්වයේ වඩාත් ප්‍රමුඛ අංගලක්ෂනයන්ගෙන් සරලව පටන්ගැනීම මගින් වර්ධනය කල නොහැකි ය. එම අංගලක්ෂනයන් ම හෝ පැවති කාරනා පැනනැගී වර්ධනය වූයේ කෙසේ දැයි වටහා ගැනීමට අපට සිදුවේ. තත්වය පිලිබඳව අපගේ තක්සේරුව පදනම්ව ඇත්තේ සිද්ධීන්ගේ ස්වභාවය මත නොව, පූර්ව අගැයීම් හා විප්ලවවාදී ව්‍යාපාරයේ සමස්ත ඓතිහාසික අරගලය මත ය.

ඈන්ආබර් රැස්වීමට ඉදිරිපත් කල ඔහුගේ වාර්තාව තුල ඩේවිඩ් නෝර්ත්, 1988 අපගේ ඉදිරිදර්ශන යෝජනාවලිය විශ්ලේෂනය කලේ ය. මෙහිදී එම යෝජනාවේ අක්ෂය වෙත අවධානය යෙදීමට මට අවශ්‍ය කෙරේ. ජාත්‍යන්තර නිෂ්පාදනයේ නව රූපාකාරයන් හි ඓතිහාසික වැදගත්කම මත අපගේ සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය පදනම් කල බව අපි එහි දී පැහැදිලි කලෙමු. නිෂ්පාදනයේ භූගෝලීයකරනය ධනේශ්වර නිෂ්පාදන ක්‍රමයේ ප්‍රධාන පරස්පරයන්ගේ තීව්‍රතාවය නව මුදුනකට නංවා ඇති බව අප අවධාරනය කලෙමු. එනම් පෞද්ගලික දේපල අයිතියේ පද්ධතිය ඓතිහාසිකව පදනම්ව ඇති ජාතික රාජ්‍ය පද්ධතිය හා ලෝක ආර්ථිකය අතර විසංවාදය යි.

ඉදිරිදර්ශනයක්, අප නොයෙක් විට අවධාරනය කර ඇති පරිදි අනාවැකියක් හෝ සහතික පත්‍රයක් නො වේ. එය පක්ෂයේ ක්‍රියාශීලී දිශානතිය හා ඓතිහාසික ක්‍රියාවලිය තුල එහි මැදිහත්වීම සඳහා පදනම සපයන්නා වූ විශ්ලේෂනයකි. පසුගිය දශක එක හමාර පුරා දේශපාලන භූලක්ෂනයෙහි අතිශය වැදගත් වෙනස්කම් දෙක එනම් සෝවියට් සංගමයේ හා ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳවැටීම ද, එක්සත් ජනපද මිලිටරිවාදයේ පුපුරා හැලීම ද, පිලිබඳව අපගේ ඉදිරිදර්ශනය පරීක්ෂාකර බලමු.

1988 යෝජනාව සෝවියට් සංගමයේ බිඳවැටීම ගැන ''අනාවැකි'' පලකලේ නැති නමුදු ගොර්බචෙව් නායකත්වයේ ධනේශ්වර පුනස්ථාපන ක්‍රියාමාර්ගය හා එහි අවශ්‍ය දිශානතිය ඉන් පැහැදිලි කරනු ලැබීය. සෝවියට් සංගමය නිල වසයෙන් විසුරුවා හැරීමටත් පෙර දී ජාත්‍යන්තර කමිටුව එහි ඉදිරිදර්ශන යෝජනාව මත පදනම්ව, ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ නොවැලැක්විය හැකි අර්බුදය පැහැදිලි කර තිබුනි.

එක්සත් ජනපද සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ වර්කස් ලීගය එහි ඉදිරිදර්ශන යෝජනාව තුල 1990 පෙබරවාරියේ දී මෙසේ සඳහන් කලේ ය.

''නැගෙනහිර යුරෝපීය පාලන තන්ත්‍රයන් බිඳී විසිරී යෑම, සමස්තයක් ලෙස ලෝක ආර්ථිකයේ වර්ධනයෙන් වෙන් කොට පැහැදිලි කල නොහැකි ය. නැගෙනහිර යුරෝපයේ සමාජ කලබැගෑනි හෙලිදරව් කරනුයේ ස්ටැලින්වාදයේ අර්බුදය පමනක් නො වේ. ඔවුන් ලෝක අධිරාජ්‍යවාදයේ පොදු අර්බුදයෙහි, ඉහලම ප්‍රකාශනය යි. නැගෙනහිර යුරෝපයේ ස්ටැලින්වාදී තන්ත්‍රයන් නිර්ධන පන්ති විප්ලවය යටපත් කිරීම සඳහා, ස්ටැලින්වාදයේ ද සහභාගිත්වයෙන්, දෙවැනි ලෝක සංග්‍රාමය අවසානයේ දී අධිරාජ්‍යවාදය විසින් පිහිටුවන ලද දේශපාලන රාමුවෙහි අත්‍යාවශ්‍ය අංගයක් විය.''

ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීම අඟවා සිටින්නේ අධිරාජ්‍යවාදයේ පොදු අර්බුදය යන මෙම තක්සේරුව, වෙලඳපොලෙහි විජයග්‍රහනය හා සමාජවාදයේ අවසානය නිවේදනය කල ධනේශ්වර දෘෂ්ටිමය නියෝජිතයන්ගේ ජය ඝෝෂාවන්ට සෘජු ලෙස ම ප්‍රතිවිරුද්ධව ගමන් කලේ ය. මෙය එක්කෝ ''සියවසේ මධ්‍යම රාත්‍රිය'' නැත හොත් ස්ටැලින්වාදී තන්ත්‍රයන්ගේ බිඳ වැටීමෙහි අර්ථය වාම බලවේගයන්ගේ යම් ආකාරයක ''යලි ඒකරාශී වීමක්'' විය හැකි යයි කියා පෑ මධ්‍යම පන්තික රැඩිකල් ප්‍රවනතාවන්ට ද එය විරුද්ධ විය.

කම්කරු පන්තියේ සැලකිය යුතු දේශපාලන විරුද්ධත්වයකින් තොරව සෝවියට් සංගමය දිය කර දැමීම නිසැකව ම දැඩි ප්‍රහාරයක් විය. එය වනාහි දශක ගනනාවක් පුරා කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය යටපත් කිරීම් ද ස්ටැලින්වාදයේ පාවාදීම්වල ද ප්‍රතිඵලය වසයෙන් හට ගත් ගැඹුරට මුල්බැස තිබූ ඉදිරිදර්ශනයේ අර්බුදයක නිමැවුම විය. බ්‍රිතාන්‍යයේ තැචර් ආන්ඩුවට විරෝධය වැඩී යාම, ඕස්ට්‍රේලියානු ලේබර් ආන්ඩුව කෙරේ විරුද්ධත්වය

ගැඹුරු වීම, එක්සත් ජනපද පතල් කම්කරු අරගලය වැනි කම්කරු පන්තියේ වර්ධනය වන සටන්කාමීත්වය මෙන් ම 1987 කොටස් වෙලඳපොලෙහි බිඳවැටීම, ජපාන උත්පාතය අවසන් වීම, යුරෝපයේ විශාල කොටසක ආර්ථිකයේ පල්වීම, හා මූල්‍ය වෙලඳපොලවල කලබැගෑනි වැනි වර්ධනය වන ආර්ථික ගැටලුවල කොන්දේසි ද යටතේ නිසැකව ම එම තත්වය ධනේශ්වර පර්යායට දේශපාලන උත්තේජනයක් සම්පාදනය කලේ ය. සෝවියට් සංගමය බිඳ විසුරුවා දැමීම ධනේශ්වරයට කෙටිකාලීන දේශපාලන වාසි සලසනු ලැබුව ද, ධනවාදයට එමගින් නව ඓතිහාසික ඉදිරි මාවතක් සම්පාදනය නො කලේ ය. එමගින් නව සමතුලිත තාවක පදනම දමනු ලැබුවේ ද නැත.

සියල්ලටම වඩා එමගින් භූගෝලකෘත නිෂ්පාදනය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර ගැඹුරුවන පරස්පරවිරෝධය ජයගත හැකි ද්‍රව්‍යමය මාධ්‍යයන් පාලක පන්තීන් වෙත සම්පාදනය නො කලේ ය. පශ්චාත් යුද්ධ දේශපාලන පර්යායේ අවසානය වැඩිමනත්ව අර්ථවත් කලේ, සමාජයේ ආර්ථික පදනම තුල පවත්නා වූ මෙම ප්‍රතිවිරෝධය දැන් ප්‍රධාන ධනපති බලයන් අතරම උග්‍රවන විවෘත ගැටුම්වලට තුඩුදෙමින් දේශපාලන උපරිව්‍යූහය තුල සෘජු ප්‍රකාශනයක් අත්කර ගැනීමට පටන් ගෙන ඇති බව යි.

1992 දී පෙන්ටගනය විසින් සකස්කල ආරක්ෂක සැලසුම් මාර්ගෝපදේශක ලියවිල්ල අවධාරනය කලේ පශ්චාත් සීතල යුද්ධ වකවානුවේ එක්සත් ජනපදය මුහුනපාන ප්‍රධාන මූලෝපායික කර්තව්‍ය, ආර්ථික හෝ මිලිටරිමය වසයෙන්, එක්සත් ජනපදයට අභියෝග කිරීමට සමත් බලයක හෝ බල කන්ඩායමක නැගී ඒම වැලැක්වීම බව යි.

මෙය, එක්සත් ජනපද මිලිටරිවාදී පුපුරා හැලීම ලෙස පසුගිය දශක එකහමාර පුරා දේශපාලන භූතලයේ පැවති දෙවැනි ප්‍රධාන වෙනස්කම කරා අප ගෙනඑයි. ඉරාක යුද්ධය ද පශ්චාත් යුද්ධ අවධිය තුල ජාත්‍යන්තර සබඳතාවන් පාලනය කල සියලු ප්‍රඥප්තීන් පෙරලා දැමීම ද, ඇමරිකානු නීති පද්ධතියේ මූලධර්මයන් ඉවත දැමීම ද, සාපරාධී මැර තන්ත්‍රයක පැන නැගීම සමග එක්ව කුමන හෝ බලගතු විරුද්ධත්වයක් ඊට එරෙහිව දියත් කිරීමට දේශපාලන සංස්ථාපිතයට නොහැකි වීම ද, වැනි දේ පැන නැගීමට ගැඹුරු ආර්ථික-සමාජ මූලයන් තිබිය යුතු ය.

අපගේ මුල් විශ්ලේශනයෙහි පදනම මත අප පැහැදිලි කලේ, ඇමරිකානු යුදවාදයේ පුපුරා යාම නියෝජනය කරන්නේ, එකම බලයක් එනම් එක්සත් ජනපදය විසින් භූගෝලීයකරන ක්‍රියාවලියෙන් පැනනගින ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය අතර ගැඹුරුවන පරස්පරය ජය ගනිමින් තමන් සුපිරි බලවතා ලෙස පිහිටුවා ගැනීමට - භූගෝලීය අධිරාජ්‍ය පර්යායක් ඇති කිරීම - දරන මංමුලා සහගත ප්‍රයත්නය යි.

**මතු සම්බන්ධයි**

© www.wsws.org